# කුලය පංතිය හා සිංහල කවිය (19 වන ශතවර්ෂයෙහි පද්‍ය කාව්‍යයන් ආශ්‍රයෙන් කරන විමර්ශනයකි)

ඔලගන්වත්තේ චන්දසිරි හිමි[1]

මෙම පර්යේෂණාත්මක ලිපියෙන් ඉදිරිපත් කරනුයේ 19වන ශත වර්ෂයේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතේ පැවති කාල පරිච්ඡේදයේ දී කාව්‍ය රචකයන් තත්කාලීන සමාජයෙහි කුලධුරාවලිය හා තදනුබද්ධ සමාජ සංස්ථාව කෙසේ නිරූපණය කර ඇත්තේ ද යන්න විමර්ශනය කිරීමය. මෙහි ලා විවිධ සමාජ විද්‍යාත්මක සිද්ධාන්තයන් ද උපයෝගි කර ගනිමින් විමර්ශනය කිරීමට නියමිතය.

ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික සමාජය බටහිර යුද්ධ ආක්‍රමණ හා සංස්කෘතික ආක්‍රමණවල බල පෑම නිසා පරිවර්තනයකට භාජනය විය. බ්‍රිතාන්‍යයට මුළුමනින් ම ශ්‍රී ලංකාව යටපත් කර ගනීමට හැකිවීම නිසා මෙම බල පෑම තවදුරටත් ව්‍යාප්ත විය. මුළු ලංකා ඉතිහාසය ම 19වන සියවස තුළ දී නව මගකට යොමු කොට ශීඝ්‍රයෙන් ඉදිරියට ගෙන යාමට හේතු වූයේ කෝල්බෲක් හා කැමරන් විසින් ඉදිරිපත් කළ නිර්දේශ ක්‍රියාත්මක කිරිමයි.

19වන සියවස ආරම්භයේ දී මුහුදුබඩ ප්‍රදේශවල සමාජයේ උසස් බලතල සහ සමාජ තරාතිරමක් හිමි කරගෙන සිටි මුදලිවරුන් ප්‍රධාන කොට ගත් මුහන්දිරම්, කෝරාල, ගම්මුලාදෑනි වැනි දේශීය ප්‍රධානීන් ප්‍රබල තත්ත්වයක පසු වූ අතර බදු අය කිරීමේ පටන් අධිකරණ කටයුතු තෙක් පුළුල් බලතල ඔවුන් සතු වූ බව පෙනී යයි. කුල ක්‍රමය යටතේ නිතර ම උසස් යැයි සම්මත කුලවල පිරිසට තනතුරු ලැබීම හේතු කොට ගෙන පොදු ජනතාවට බලපෑම් කිරීමට ද ශක්තියක් ඔවුන් සතු විය.

මෙම සියවස තුළ දී මුද්‍රණ තාක්ෂණය පැතිරීම නිසා නව සාහිත්‍යයක් ව්‍යාප්ත විය. මෙම අවධියෙහි කාව්‍ය රචකයෝ සමකාලීන ජීවිතය කාව්‍යයට නැගුහ. ඒවායෙහි අලුත්

[1] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය
ඊමේල්: chandrasirihimi@hotmail.com

සමාජ ආයතන මෙන් ම විනාශ වන සමාජ ආයතන ගැන ද කරුණු ගැබ් වී ඇත. සාහිත්‍ය කලාදිය මගින් තත්කාලීන සමාජ ව්‍යුහය ප්‍රතිනිර්මාණය වන්නේය යන්න සැලකිය යුතු මතයක් වන අතර මේ සිද්ධාන්තය මත පිහිටා තත් කාලීන පද්‍ය නිර්මාණ මගින් 19වන සියවසපුරා පැවති සමාජ සංස්ථා අතර කුල සංස්ථාව විමර්ශනය කිරීම පද්‍ය සාහිත්‍ය ඉතිහාසයෙහි නව මානයක් කෙරෙහි යොමුවීමක් බව පෙන්වා දිය හැකිය.

**ප්‍රමුඛ පදඃ** කවිය, සමාජ සංස්ථාව, කුලය, මුද්‍රණ තාක්ෂණය
**Title:** Caste and class in Sinhala poetry
**Keywords:** poetry, social institution, caste, printing technology